**<u>පන්විල ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුර සඳහා දෛනික පදනම මත</u>**

**<u>සේවකයෙකු යොදවා ගැනීම - 2025</u>**

පන්විල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති රියදුරු තනතුරට අදාලව දෛනික පදනම මත සේවකයෙකු යොදවා ගැනීම සඳහා පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා ඊට යාබදව පිහිටි පළාත් පාලන ආයතන වන පාතදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, වත්තේගම නගර සභා බල ප්‍රදේශය, කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හා රත්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය යන පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි ස්ථිර පදිංචිය ඇති, මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2025.03.21 දිනට පෙර ලේකම්. පන්විල ප්‍රාදේශීය සභාව, පන්විල යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අදාල අයදුම්පත්‍රය මෙම සභාව වෙත පැමිණ ලබා ගැනීමට හෝ https://panwila.ps.gov.lk/ දරණ ප්‍රාදේශීය සභා නිල වෙබ් අඩවිය තුලින් බාගත කරගත හැක.

**01. සපුරාලිය යුතු සුදුසුකම් :-**

**1.1 අධ්‍යාපන සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයන් 05 ක් එක වරකදී සමත්වී තිබිය යුතුයි.

**1.2 වෘත්තීය සුදුසුකම්** :

1.2.1 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පහත සඳහන් කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.
B1, B, C1, C, CE, D1, D, G1, G හා J

1.2.2 ට්‍රැක්ටර් රථ පැදවීම සඳහා බලපත්‍ර ලබා තිබීම අනිවාර්ය වේ.

1.2.3 බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු සඳහා බලපත්‍ර ලබා තිබීම විශේෂ සුදුසුකම් සේ සලකා බලනු ලැබේ.

**1.3 පළපුරුද්ද** :-මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.)

**02. වයස**:- අවු :18-45 අතර අයවලුන් විය යුතුය.

**03. කායික සුදුසුකම් :-**

I. සෑම අපේක්ෂකයෙකුටම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02 ½ ක් විය යුතුය.

**04.සේවයේ යොදවගන්නා ක්‍රමය :-**

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබාගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබා ගන්නා අයවලුන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබාගත යුතුය.

**05.පොදු කොන්දේසි :-**

I. අයදුම්කරු ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් ඉහත සඳහන් ප්‍රාදේශීය සභා අතුරින් කවර හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් තුළ වසර 03කට නොඅඩු ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

III. මහාමාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතුය.

IV. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

V. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබුවකු හෝ රජයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවකු නොවිය යුතුය.

VI. සේවයේ යොදවාගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුය.

VII. සේවයේ යොදවාගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

VIII. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වූවද පන්විල ප්‍රාදේශීය සභා ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

**06.සැලකිය යුතු කරුණු:-**

I. අදාළ තනතුරේ සේවයේ යොදවා ගැනීම සඳහා එක් සේවකයෙකු පමණක් තෝරා පත් කරගනු ලැබේ.

II. අදාළ තනතුරට සුදුස්සෙකු තෝරා ගැනීමේදී පන්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

III. සේවයේ යොදවා ගැනීමට පූර්වයෙන් අදාළ සේවකයා ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුමකට බැඳී සිටිය යුතුය.

IV. කිසිවිටකත් මෙම පත්වීම ස්ථිර පත්වීමක් ලබාගැනීමට සුදුසුකමක් සේ සලකා බලනු නොලැබේ.

V. සේවයේ යොදවන දිනයේ පමණක් දෛනික වැටුපක් ගෙවීමට කටයුතු කරන අතර, දිනකට අවම පැය 09 ක කාලයක් සේවයේ යෙදිය යුතුය.

ලේකම්
පන්විල ප්‍රාදේශීය සභාව
පන්විල

වැඩි විස්තර සඳහා :- 081-2472028 දරණ දුරකථන අංකයට අමතන්න.

## පන්විල ප්‍රාදේශීය සභාව

## රියදුරු තනතුර සඳහා දෛනික පදනම මත සේවකයන් යොදවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය -2025

1. මුලකුරු සමඟ නම :-..........................................................................................................................

   මුලකුරුවලින් හැඳින්වෙන නම් :-...........................................................................................

2. ස්ථිර පදිංචි ලිපිනය :-...........................................................................................................................

3. දුරකථන අංකය :- ..............................................................................................................................

4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :-..................................................................................................................

5. ජාතික හැඳුනුම්පත් අංකය :-.................................................................................................................

6. උපන් දිනය :- අවුරුද්ද:-...................................., මාසය :-........................., දිනය :-.............................

7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :-.......................................................................................

8. ස්ත්‍රී/පුරුෂ භාවය :- ..............................................................................................................................

9. විවාහක /අවිවාහක :-..........................................................................................................................

10. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද /ලියාපදිංචිවීමෙන් ද යන වග :-..................................................

11. අධ්‍යාපන සුදුසුකම්:- (සහතික වල පිටපත් ඇමිණිය යුතුය.)

    අ.පො.ස (සා.පෙළ) විභාගය සමත් වර්ෂය :-................................... අංකය :-............................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වර්ෂය :-................................... අංකය :-............................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

12. (i) වෙනත් සුදුසුකම් :-...........................................................................................................................

    ..........................................................................................................................

    (ii) වෘත්තීය සුදුසුකම් :-.........................................................................................................................

    ..........................................................................................................................

    (iii) සේවා පළපුරුද්ද :-.............................................................................................................................

    ..........................................................................................................................

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද? එසේනම් ඒ පිළිබඳ විස්තර:-...........................................................................................................................................

පහත සඳහන් ලිපි ලේඛණ වල ඡායා පිටපත් මේ සමඟ අමුණා ඇත.

- උප්පැන්න සහතිකය ☐
- අධ්‍යාපනික සහතික ☐
- වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ☐
- සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ☐
- ස්ථිර පදිංචිය තහවුරු කිරීමේ සහතිකය (ග්‍රාම නිලධාරි සහතිකය අවම මාස 03 ක් ඇතුලත ලබාගත් ) ☐

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි.

දිනය :-...............................

.....................................................
අයදුම්කරුගේ අත්සන